# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

# நலன்புரி நன்மைகள் சபை

# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| මගේ අංකය / எனது இல / My No. | WBB/DS/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | . 10. 2022 |
|---|---|---|---|---|---|

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු පවුල් / තැනැත්තන් හඳුනා ගැනීම - 2022</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අයදුම්පත් කැඳවීම දැනට ආරම්භ කර ඇති අතර අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය ඔක්තෝබර් 28 වේ. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබෙන අයදුම්පත්‍ර දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් ද මේ වන විට ක්‍රියාත්මක කර තිබේ. දැනට අප වෙත ලැබෙන විමසීම් වලට අදාළව පහත සඳහන් උපදෙස් ලබා දෙනු ලබන අතර ඒ සඳහා ඔබගේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

02. පුවත්පත් මගින් ප්‍රසිද්ධ කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ 04 වන කරුණ යටතේ අයදුම්කරුවන් විසින් ජාතික හැඳුනුම්පත් අංකය හෝ වෙනත් හැඳුනුම්පත් අංකයක් සඳහන් කළ යුතුය. මූලික අයදුම්පත්‍ර දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේදී ද එය අනිවාර්යෙන් සපුරාලිය යුතු අවශ්‍යතාවයකි.

03. මෙහිදී ගෘහ මූලිකයාට ජාතික හැඳුනුම්පතක් නොමැති අවස්ථාවකදී පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකිය.

a. පවුලේ හැඳුනුම්පත් අංකයක් හිමි කවර සාමාජිකයෙකු හෝ නමින් දත්ත ඇතුළත් කිරීම.
b. වැඩිහිටි හැඳුනුම්පතක් සකසා දීමට සුදුසු පුද්ගලයෙකු පවුලේ සිටී නම් වැඩිහිටි හැඳුනුම්පතක් නිකුත්කර ඒ ඇසුරෙන් අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් ලබාදීම.
c. ඉහත a, b ක්‍රියාමාර්ග කිසිවක් අනුගමනය කළ නොහැකි නම් සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන සඳහා අදාළ පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කරමින් විධිමත් අංකයක් සහිත ලිපියක් ඔබ විසින් නිකුත් කර එම ලිපියේ අංකය ඇසුරෙන් අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් ලබාදීම.

- ඉහත ලිපිය මගින් යම් පුද්ගලයෙකුට ලබා දෙනු ලබන අංකය පහත සඳහන් උපදෙස් පරිදි නිකුත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

  Dis /Div/…

  දිස්ත්‍රික්කයේ නමෙහි මුලකුරු තුන/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නමෙහි මුලකුරු තුන/අංකය